# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2130/45 - 2019 ජූලි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2019.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඩී.-බී. 3/92 (III)**

**1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සහ 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 34 වන වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 64 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 ජූලි මස 04 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

කලින් කල සංශෝධිත පරිදි වූ, 1993 නොවැම්බර් මස 26 වන දින අංක 794/23 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1993 අංක 1 දරන පතල් කැනීම් (බලපත්‍ර දීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 5 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"5. (1) (අ) ගවේෂණ බලපත්‍රයක් දරන්නකු විසින්, කාර්යාංශය විසින් එම තැනැත්තාට ගවේෂණ බලපත්‍රයක් නිකුත් කර ඇති ප්‍රදේශයක් සම්බන්ධයෙන්, "අ", "ආ", "ඇ" සහ "ඈ" වර්ග යටතේ කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක් සඳහාවන ඉල්ලුම්පත පෞද්ගලිකව ඉදිරිපත් කළ යුතු අතර, එම ඉල්ලුම්පත මෙහි 3:1 ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(ආ) කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක් අලුත් කිරීම හෝ ආපසු භාරදීම සඳහා -

(i) අවස්ථාවෝචිත පරිදි, "අ" හෝ "ආ" වර්ගය යටතේ වන, මෙහි 3:2 ආකෘතියට සාරානුකූල විය යුතු ඉල්ලුම්පතක්;

(ii) "ඇ" හෝ "ඈ" වර්ගය යටතේ වන මෙහි 3:3 ආකෘතියට සාරානුකූල විය යුතු ඉල්ලුම්පතක්:

එසේ වුව ද, කාර්යාංශය විසින් -

(අ) "අ" , "ආ" , "ඇ" හෝ "ඈ" වර්ගය යටතේ කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පතකට අදාළ මුහුදු වැලි හැර වෙනත් ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා; සහ

(ආ) "ඇ" හෝ "ඈ" වර්ගය යටතේ කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පතකට අදාළ සිප්පිකටු, තලාතු මිනිරන් (මයිකා), තිරිවානා, හුණුගල්, කැල්සයිට්, ඩොලමයිට්, බෝල්මැටි, කෙඔලින් (කිරිමැටි), ෆෙල්ස්පාර් සහ සිලිකා වැලි සඳහා,

ගවේෂණ බලපත්‍රයක් තිබීමේ අවශ්‍යතාව නොලසකා හැරීම සම්බන්ධයෙන් සලකා බලනු ලැබිය හැකි ය.

(ඇ) "අ" හෝ "ආ" වර්ගය යටතේ කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක් පැවරීම සහඑම බලපත්‍රය යම් බැඳීමක් සඳහා ඇපයක් වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා වන ඉල්ලුම්පත පිළිවෙළින් මෙහි 3:4 සහ 3:5 යන ආකෘතීන්ට සාරානුකූලව විය යුතු ය.

(2) කාර්මික පතල් කැණීමේ බලපත්‍රයකින් ආවරණය වන ප්‍රදේශය නිධිය පිහිටි ප්‍රදේශය සහ පිරියත, උපාංග සහ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සහ කැණීම් කටයුතු සඳහා අත්‍යවශ්‍යවන වෙනත් සවිකිරීම් සඳහා අවශ්‍ය අතිරේක ප්‍රදේශවලින් සංයුක්ත විය යුතු ය.

(3) (අ) "අ" වර්ගය යටතේ වන කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක්, 10 වන ආකෘතියේ නිශ්චිතව දක්වා ඇති ආර්ථික ජීව්‍යතා වාර්තාව මගින් තහවුරු කරන ලද ඛනිජ ද්‍රව්‍ය සංචිතවල ලේඛන මත පදනම් ව කාර්යාංශය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවකට වලංගු විය යුතු ය.

(ආ) "ආ", "ඇ" සහ "ඈ" වර්ග යටතේ වන කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක්, අලුත් කිරීමට යටත්ව, වසර එකකට නොවැඩි කාලසීමාවකට වලංගු විය යුතු ය.

(ඇ) "අ" වර්ගය යටතේ වන කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක් දරන්නකු විසින්, පවත්නා සංචිත සහ එහි වාණිජ නිෂ්පාදන සම්බන්ධයෙන් එම බලපත්‍රය දරන්නා විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛන සැලකිල්ලට ගෙන කාර්යාංශය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා එකී බලපත්‍රය අලුත් කිරීම සඳහා කාර්යාංශය වෙත ඉල්ලුම්පතක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) "අ" සහ "ආ" වර්ග යටතේ වන කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා හෝ පැවරීම සඳහා හෝ එම කාර්මික පතල් කැණීමේ බලපත්‍රය යම් බැඳීමක් සඳහා ඇපයක් වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් ම, 35 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සහ 13 වන නියෝගයේ දක්වා ඇති ලේඛන ඇතුළු එය ක්‍රියාකරවීමට අදාළ සියලු ලේඛන සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(5) "අ", "ආ", "ඇ" සහ "ඈ" වර්ග යටතේ වන කාර්මික පතල් කැණීමේ බලපත්‍රයක් මගින්, ඉල්ලුම්කරුට පහත දැක්වෙන පරිදි වර්ගීකරණය කරනු ලබන ඒ බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය ඇතුළත කණින ලද අදාළ අවසරලත් ඛනිජ ද්‍රව්‍යවලට අදාළ නියම හා කොන්දේසිවලට අනුකූලව ගවේෂණය කිරීමට, කැණීමට, සේදීමට, පිරිසිදු කිරීමට, යන්ත්‍රානුසාරයෙන් කැබලි කිරීමට, වෙන් කිරීමට, ගබඩා කිරීමට, වෙළඳාම් කිරීමට සහ "අ" වර්ගය යටතේ වන පතල් කැණීමේ බලපත්‍රය සඳහා කාර්යාංශයේ විශේෂ අධිකාරය මත එම ඛනිජ ද්‍රව්‍ය අපනයනය කිරීමට හිමිකම් ලබා දිය යුතු ය.

**"අ" වර්ගය** - පහත දැක්වෙන උපමානවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් විය යුතු ය:-

(අ) පිපිරවීමේ ක්‍රමවේදය බහු බෝර වළවල් ක්‍රමයට විය යුතු අතර, අධිබලැති පුපුරණ ද්‍රව්‍ය සහ විදුලි ඩෙටනේටර්ස් පහකට (5) වැඩි සහ බෝර වලවල් පහකට (5) වැඩි සංඛ්‍යාවක් භාවිත කරමින් එකවර පිපිරවිය යුතු ය;

(ආ) බෝර වළක ගැඹුර මීටර් තුනකට (3) වැඩි විය යුතු ය;

(ඇ) නිෂ්පාදන පරිමාව එක් මසකට කියුබ් දෙදහසකට (2000) වැඩි විය යුතු ය;

(ඈ) කාර්යාංශය විසින් භාවිත කිරීම සඳහා අවසර දෙන ලද යන්ත්‍රෝපකරණ ඩ්රේජර්, ට්‍රැක් ඩ්‍රිල්, ජැක් හැමර්, කම්ප්‍රෙෂර්, රොක් බ්‍රේකර්, ෆ්‍රරන්ට් එන්ඩ් ලෝඩර්, එස්කැවේටර් සහ බැකෝ ලෝඩර් විය යුතු ය;

(ඉ) කාර්යාංශය විසින් අවසර දෙනු ලබන වෙනත් යම් යන්ත්‍රෝපකරණ භාවිත කිරීම;

(ඊ) කණින ප්‍රදේශය හෙක්ටයාර දහයකට (10) වැඩි විය යුතු ය;

(උ) පතලේ ගැඹුර මීටර විසිපහකට (25) වැඩි විය යුතු ය;

(ඌ) බෝර වළේ විෂ්කම්භය මිලිමීටර හතලිස්දෙකකට (42) වැඩිවිය යුතු ය.

**"ආ" වර්ගය** - පහත දැක්වෙන උපමානවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් විය යුතු ය:-

(අ) පිපිරවීමේ ක්‍රමවේදය බහු බෝර වළවල් ක්‍රමයට විය යුතු අතර, අධිබලැති පුපුරණ ද්‍රව්‍ය සහ විදුලි ඩෙටනේටර් පහකට (5) නොවැඩි සහ බෝර වළවල් පහකට (5) නොවැඩි සංඛ්‍යාවක් භාවිත කරමින් පිපිරවිය යුතු ය;

(ආ) පිපිරවීමේ ක්‍රමවේදය බහු බෝර වළවල් සහිත විය යුතු අතර, ඩෙටනේටර් කෝඩ් භාවිතයෙන් පිපිරවීම කළ යුතුය. නැතහොත් පිපිරීමක් සිදුනොවන ක්‍රමයකින් ප්‍රසාරණය කිරීම කළ යුතු ය;

(ඇ) බෝර වළක ගැඹුර මීටර් තුනක් (3) නොඉක්මවිය යුතු ය;

(ඈ) කාර්යාංශය විසින්, භාවිත කිරීම සඳහා අවසර දෙන ලද යන්ත්‍රෝපකරණ ඩ්රේජර්, ජැක් හැමර්, කම්ප්‍රෙෂර්, රොක් බ්‍රේකර්ස්, ෆ්‍රරන්ට් එන්ඩ් ලෝඩර්ස්, එස්කැවේටර් සහ බැකෝ ලෝඩර් විය යුතු ය;

(ඉ) කාර්යාංශය විසින් අවසර දෙනු ලබන වෙනත් යම් යන්ත්‍රෝපකරණ භාවිත කිරීම;

(ඊ) නිෂ්පාදන පරිමාව එක් මාසයකට කියුබ් දෙදහසක් (2000) නොඉක්මවිය යුතු ය;

(උ) පතලේ ගැඹුර මීටර් විසිපහක් (25) නොඉක්මවිය යුතු ය;

(ඌ) කණින ප්‍රදේශය හෙක්ටයාර දහයක් (10) නොඉක්මවිය යුතු ය;

(එ) බෝර වළේ විෂ්කම්භය මිලිමීටර හතලිස්දෙකක් (42) නොඉක්මවිය යුතු ය.

**"ඇ" වර්ගය** - පහත දැක්වෙන උපමානවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් විය යුතු ය:-

(අ) පිපිරවීමේ ක්‍රමවේදය තනි බෝර වළක් විය යුතු ය;

(ආ) බෝර වළේ ගැඹුර මීටර් තුනක් (3) නොඉක්මවිය යුතු ය;

(ඇ) නිෂ්පාදන පරිමාව මාසයකට කියුබ් එක්දහසක් (1000) නොඉක්මවිය යුතු ය;

(ඈ) කාර්යාංශය විසින්, භාවිත කිරීම සඳහා අවසර දෙන ලද යන්ත්‍රෝපකරණ ජැක් හැමර්, කම්ප්‍රෙෂර්, රොක් බ්‍රේකර්ස්, ෆ්‍රරන්ට් එන්ඩ් ලෝඩර්ස්,එස්කැවේටර් සහ බැකෝ ලොඩර් විය යුතු ය;

(ඉ) කණින ප්‍රදේශය හෙක්ටයාර දෙකක් (2) නොඉක්මවිය යුතු අතර, පතලේ ගැඹුර මීටර් විසිපහක් (25) නොඉක්මවිය යුතු ය.

**"ඈ" වර්ගය** - පහත දැක්වෙන උපමානවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් විය යුතු ය:-

(අ) පිපිරවීමේ ක්‍රමවේදය තනි බෝර වළක් විය යුතු ය;

(ආ) බෝර වළේ ගැඹුර මීටර් එකයි දශම පහක් (1.5) නොඉක්මවිය යුතු ය;

(ඇ) නිෂ්පාදන පරිමාව මාසයකට කියුබ් පන්සියයක් (500) නොඉක්මවිය යුතු ය;

(ඈ) කාර්යාංශය විසින් භාවිත කිරීම සඳහා අවසර දෙන ලද යන්ත්‍රෝපකරණ කම්ප්‍රෙෂර් සහිත ජැක් හැමර්, ෆරන්ට් එන්ඩ් ලෝඩර්ස් සහ එස්කැවේටර් විය යුතු ය;

(ඉ) කණින ප්‍රදේශය හෙක්ටයාර දෙකක් (2) නොඉක්මවිය යුතු අතර, පතලේ ගැඹුර මීටර විසිපහක් (25) නොඉක්මවිය යුතු ය.

(6) (අ) බලපත්‍රලාභියා විසින්, කාර්යාංශය විසින් "අ" හෝ "ආ" වර්ගය යටතේ කාර්මික කැණීමේ බලපත්‍රයක් ප්‍රදානය කර මාස දහඅටක (18) කාලසීමාවක් ඇතුළත අනුමත ආර්ථික ජීව්‍යතා වාර්තාවේ දක්වා ඇති පරිදි වාණිජ නිෂ්පාදනය ආරම්භ කරනු ලැබිය යුතු ය.

(ආ) බලපත්‍රලාභියාට නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත දී වාණිජ නිෂ්පාදනය ආරම්භ කිරීමට නොහැකි වන අවස්ථාවක දී, එම වාණිජ නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා වන කාලසීමාව දීර්ඝ කරගැනීම සඳහා කාර්යාංශය සමඟ සාකච්ඡා කළ හැකි ය.

(ඇ) "අ" සහ "ආ" වර්ග යටතේ කාර්මික කැණීමේ බලපත්‍රයක් දරන්නකු විසින් නිශ්චිත කාලසීමාව ඇතුළත හෝ කාර්යාංශය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි යම් දීර්ඝ කරන ලද කාලසීමාවක් ඇතුළත වාණිජ නිෂ්පාදනය ආරම්භ කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ඔහුට ප්‍රදානය කරන ලද කාර්මික කැණීම් බලපත්‍රය, කාර්යාංශය විසින් අවසන් කරනු ලැබීමකට යටත් විය යුතු ය";

(2) 13 වන නියෝගයේ -

(අ) එහි (1) වන උපනියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(1) "අ" සහ "ආ" වර්ග යටතේ කාර්මික කැණීමේ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන ඉල්ලුම්පත -

(අ) මෙහි 10 ආකෘතියේ නිශ්චිතව දක්වා ඇති විස්තර, සැලසුම් සහ සිතියම් ඇතුළත් වන ආර්ථික ජීව්‍යතා වාර්තාවක්; සහ

(ආ) මෙහි 10 ආකෘතියේ නිශ්චිතව දක්වා ඇති විස්තර ඇතුළත් සහ කාර්මික කැණීමේ බලපත්‍රයක් ප්‍රදානය කිරීමට පෙර කාර්යාංශය විසින් අනුමත කරන ලද කැණීමේ ප්‍රතිෂ්ඨාපන සැලැස්මක්,

සමඟ එවිය යුතු ය.";

(ආ) එහි (1) වන උපනියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස අතුළත් කිරීමෙන්:-

"(1අ) "ඇ" සහ "ඈ" වර්ගවල කාර්මික කැණීමේ බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන ඉල්ලුම්පතක්, මෙහි 10අ ආකෘතියේ නිශ්චිතව දක්වා ඇති විස්තර ද අඩංගු සහ කාර්මික කැණීමේ බලපත්‍රය ප්‍රදානය කිරීමට පෙර කාර්යාංශය විසින් අනුමත කරන ලද කැණීම් පුනරුත්ථාපනය කිරීමේ සැලැස්මක් ද සමඟ විය යුතු ය.";

(3) 35(1) වන නියෝගයේ -

(අ) "ශිල්පීය කැනීම් බලපත්‍රයක් නිකුත් කිරීම සහ අලුත් කිරීම -

"අ" වර්ගය .................................. රු. 2,000/=හෙ

"ආ" වර්ගය ................................ රු. 1,000/=හෙ"

යන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"ශිල්පීය කැණීම් බලපත්‍රය නිකුත් කිරීම සහ අලුත් කිරීම -

"අ" වර්ගය .................... වසරකට හෙක්ටයාරයක් සඳහා රු. 5,000/-;

"ආ" වර්ගය ................... වසරකට හෙක්ටයාරයක් සඳහා රු. 2,000/-";

(ආ)"කාර්මික පතල් කැනීම් බලපත්‍ර නිකුත් කිරීම සහ අලුත් කිරීම-

"අ" වර්ගය - හෙක්ටයාරයකට රු. 15,000/=

"ආ" වර්ගය - හෙක්ටයාරයකට රු. 5,000/=

"ඇ" වර්ගය - හෙක්ටයාරයකට රු. 2,500/="

යන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"කාර්මික පතල් කැණීම් බලපත්‍රය නිකුත් කිරීම සහ අලුත් කිරීම-

"අ" වර්ගය ....................... වසරකට හෙක්ටයාරයක් සඳහා රු. 50,000/-;

"ආ" වර්ගය ..................... වසරකට හෙක්ටයාරයක් සඳහා රු. 30,000/-;

"ඇ" වර්ගය ..................... වසරකට හෙක්ටයාරයක් සඳහා රු. 10,000/-;

"ඈ" වර්ගය ..................... වසරකට හෙක්ටයාරයක් සඳහා රු. 5000/-;

දියඹේ වැලි - වෙනත් බලපත්‍ර වර්ගයන්හි ලියාපදිංචි ගාස්තුවෙන් 50% .";

(4) 3.1, 3.2, 3.2(අ) හා 3.3 ආකෘති ඉවත් කර ඒ වෙනුවට පිළිවෙළින් පහත දැක්වෙන ආකෘති ආදේශ කිරීමෙන්:-

(5(1) නියෝගය)
3.1 ආකෘතිය

**" කාර්මික පතල් කැණීමේ බලපත්‍රය**
**"අ", "ආ", "ඇ" හෝ "ඈ" වර්ග**
**ඉල්ලුම්පත**

1. ගවේෂණ බලපත්‍ර අංකය (අදාළවන අවස්ථාවක දී): ..........................................................................................................

2. පුද්ගලයකු සඳහා :
   (අ) ඉල්ලුම්කරුගේ/බලයලත් අනුයෝජිතයාගේ නම: ..........................................................................................

   (ආ) ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................................................

   (ඇ) ලිපිනය: ..........................................................................................................................

   (ඈ) ජාතිය: ..........................................................................................................................

   (ඉ) රැකියාව සහ සේවායෝජකයාගේ නම: ..............................................................................................

   (ඊ) ශ්‍රී ලංකාවෙහි:

      (i) ව්‍යාපාර ස්ථානය : ..............................................................................................................

      (ii) පදිංචිය : ........................................................................................................................

3. සංස්ථාව (ගවේෂණ බලපත්‍රලාභියකු නම්, 2.1 ආකෘතිපත්‍රය යාවත්කාලීන කිරීම)

   (අ) සමාගමේ/ හවුල් ව්‍යාපාරයේ නම : ..............................................................................................

   (ආ) සංස්ථාගත කළ රට : ..............................................................................................................

   (ඇ) ප්‍රධාන කාර්යාලය/ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය : ..........................................................................

   (ඈ) ශ්‍රී ලංකාවෙහි - ලියාපදිංචි සමාගමේ/ අනුයෝජිතයාගේ ලිපිනය : ................................................................

   (ඉ) නෛතික/ මූල්‍ය දත්ත :

      (i) ප්‍රාග්ධන සම්පාදනය : ..........................................................................................................

      (ii) සාංගමික ව්‍යවස්ථාවලිය (අමුණන්න): ........................................................................................

      (iii) පසුගිය වසර තුනක වාර්ෂික වාර්තා (අමුණන්න): ..........................................................................

4. තාක්ෂණික/වෘත්තීය දත්ත : (අ, ආ හා ඇ වර්ග සඳහා පමණි)

   (අ) බලයලත් ප්‍රදේශයේ මායිම් මැනීම (1:50,000 ස්ථාන නිශ්චයන සිතියම හා මෙට්‍රික් ඒකක අනුසාරයෙන් හැඳින්වීමේ 2.3 ආකෘතිපත්‍රය ද අමුණන්න)

   (ආ) ව්‍යාපෘති කණ්ඩායමේ වෘත්තීය/ තාක්ෂණික තත්ත්වය පිළිබඳ සුදුසුකම් (අමුණන්න)

   (ඇ) 10 වන ආකෘතිපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ආර්ථික ජීව්‍යතා වාර්තාව (අමුණන්න)

5. කාර්මික පතල් කැණීම් මෙහෙයුම් වර්ගය :

(අ) පිපිරවීමේ ක්‍රමවේදය :

(ආ) බෝර වළෙහි ගැඹුර :

(ඇ) නිෂ්පාදන පරිමාව :

(ඈ) භාවිත කිරීමට අපේක්ෂිත යන්ත්‍රෝපකරණ :

(ඉ) කැණීම් භූගතව සිදුකරන්නේ නම්, ආකරයේ/පතලේ ගැඹුර (අඩි/මීටර්):

(ඊ) භාවිත කිරීමට අපේක්ෂිත පුපුරණ ද්‍රව්‍යයේ වර්ගය :

6. බලපත්‍ර ප්‍රදේශය පිළිබඳ විස්තර :

(අ) ඉඩමේ නම : (ඔප්පුවේ හා පිඹුරේ පිටපත් අමුණන්න)

(ආ) ඉඩම් හිමිකරුගේ නම : (ඉල්ලුම්කරුට අයිතියක් නොමැති නම්, බදු ගිවිසුම හෝ දිවුරුම් ප්‍රකාශය අමුණන්න)

(ඇ) ඉඩම් පිහිටා ඇති ග්‍රාමයේ නම :

(ඈ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :

(ඉ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

(ඊ) පරිපාලන දිස්ත්‍රික්කය :

7. පතල් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වන සැලසුම් (අමුණන්න):

8. මායිම් ප්‍රමාණයේ ස්වභාවය (ඇත්නම්):

9. කැණිය යුතු ඛණිජ ද්‍රව්‍යය/ ද්‍රව්‍යයන්ගේ නම් :

10. බලපත්‍ර ගාස්තු රිසිට් පත (අමුණන්න)

මෙම ඉල්ලුම්පතෙහි ඇතුළත් ප්‍රකාශ, මාගේ උපරිම දැනීම අනුව සත්‍ය බව හා නිවැරදි බව මෙහි පහත අත්සන කරන මම මෙයින් සහතික කරන අතර 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූල වීමට මම මෙයින් පොරොන්දු වෙමි.

දිනය : .......................

අත්සන : ..........................................
පතල් කළමණාකරු: .......................

---

කාර්මික පතල් කැණීමේ බලපත්‍ර අංකය: ..............................

වලංගු කාලසීමාව : .......................

ගෙවිය යුතු රාජ්‍ය භාගය : .......................

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දීම :

අත්සන : ..........................................

අධ්‍යක්ෂ ජනරාල්: .......................

දිනය.............................. .

(5 (1) නියෝගය)
3.2 ආකෘතිය

**කාර්මික පතල් කැනීම් බලපත්‍රය - "අ" සහ "ආ"**
**වර්ග අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත**

(කල් ඉකුත්වීමට යටත් පිරිසෙයින් දින 90 කට පෙරාතුව ඉදිරිපත් කළ යුතු ය)

1. (i) බලපත්‍ර කාණ්ඩය සහ අංකය :..........................................................

 (ii) කල් ඉකුත්වීමේ දිනය :

2. අලුත් කිරීමේ නියමයන්:

 පළමුවන:.................. දෙවන:..................... තෙවන:...................... සිව්වන:...................... වෙනත්:................

3. 10 වන ආකෘති පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ආර්ථික ජීව්‍යතාව අඛණ්ඩව පවතින බවට සාක්ෂි: .............................

4. බලපත්‍ර ගාස්තු රිසිට්පත (අමුණන්න):..................................

5. කාර්තුමය පතල් තොරතුරු සාරාංශය ඉදිරිපත් කිරීම :

| වර්ෂය/කාර්තුව | ඉදිරිපත් කළ දිනය |
|---|---|
| ....................... | .......................... |
| ....................... | ......................... |
| ....................... | ......................... |

මෙම ඉල්ලීම්පතෙහි ඇතුළත් ප්‍රකාශ, මාගේ උපරිම දැනීම අනුව සත්‍ය බව හා නිවැරදි බව මෙහි පහත අත්සන් කරන මම මෙයින් සහතික කරමි. 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූල වීමට මම මෙයින් පොරොන්දු වෙමි.

.......................
අත්සන
(පතල් කළමනාකරු)

---

අලුත් කිරීමට අනුමත කරන ලදී :

වලංගු කාලසීමාව : ..................................

ගෙවිය යුතු රාජ්‍ය භාගය : ......................................

අධ්‍යක්ෂවරයා විසින් බලය දීම : ......................................

දිනය : .......................

.................................
අත්සන
(අධ්‍යක්ෂ ජනරාල්වරයා)

**ආපසු භාර දීම**

බලපත්‍රයේ සියලු කොන්දේසි හා නියමයන් ඉටු කර ඇත.

අධ්‍යක්ෂ ජනරාල්වරයා: .......................

දිනය : .......................

[5(1) නියෝගය]

3.3 ආකෘතිපත්‍රය

**කාර්මික පතල් කැණීමේ බලපත්‍රය - "ඇ" සහ "ඈ" වර්ග**

**අලුත් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය**

(බලපත්‍රය කල් ඉකුත් වීමට යටත් පිරිසෙයින් දින 30කට පෙරාතුව ඉදිරිපත් කළ යුතු ය)

1. බලපත්‍රයේ විස්තර ඃ

(අ) බලපත්‍රලාභියාගේ/ සමාගමේ නම :

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය/ ව්‍යාපාර ලියාපදිංචි අංකය :

(ඇ) ලිපිනය :.......................................................................................................................................................

(ඈ) බලපත්‍ර අංකය :

(ඉ) වලංගු කාලසීමාව : ........................ සිට : ........................ දක්වා

(ඊ) අලුත් කිරීමේ වාරය : ........................ ප්‍රථම/දෙවන/තෙවන/සිව්වන/පස්වන/වෙනත් (නිශ්චිතව දක්වන්න )

(උ) බලපත්‍රය යටතේ කැණීම් කරන ලද ඛනිජ ද්‍රව්‍ය(ය): ........................

(ඌ) පතල පිහිටා ඇති භූමියේ නම :

(එ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :

(ඒ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:

(ඔ) පරිපාලන දිස්ත්‍රික්කය :

2. කැණීම් ක්‍රියාවන් පිළිබඳ විස්තර :

(අ) වර්ෂය තුළ මෙහෙයුම් සිදු කරනු ලබන දින ගණන :

(ආ) සේවකයන් ගණන :

(ඇ) ගල් පුපුරවා හැරීමක් සිදු වූයේ නම්, බලපත්‍ර කාලසීමාව තුළ ලබා ගත් පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණයන් පිළිබඳ විස්තර: (පුපුරන ද්‍රව්‍ය අවසර පත්වල පිටපත් අමුණන්න)

| පුපුරණ ද්‍රව්‍ය/අවසර පතෙහි අංකය | | | | |
|---|---|---|---|---|
| ඇමෝනියම් නයිට්‍රේට් කි.ග්‍රෑ. | | | | |
| ජෙලිග්නයිට්/ඩයිනමයිට් කි.ග්‍රෑ. | | | | |
| වෙඩි බෙහෙත් කි.ග්‍රෑ. | | | | |

(ඈ) ආකරයෙන්/පතලෙන් කණින ලද මුළු පාෂාණ/ඛණිජ ද්‍රව්‍ය(ය) ප්‍රමාණය :

| *වර්ෂය* | *කාර්තුව* | *ප්‍රමාණය (කියුබ්/සන මීටර මෙට්‍රික් ටොන් ($m^3mT$))* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

3. සකස් කරන ලද සහ අගය එකතු කරන ලද නිෂ්පාදනවල විස්තර :

වර්ෂය : ......................................කාර්තු(ව): ..................................

| *නිෂ්පාදන ශ්‍රේණිය* | *ප්‍රමාණය (කියුබ්/සනමීටර මෙට්‍රික් ටොන් $m^3mT$)* | *මුළු වටිනාකම රුපියල්* |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

මෙම ඉල්ලීම්පතෙහි ඇතුළත් ප්‍රකාශ, මාගේ උපරිම දැනීම අනුව සත්‍ය බව හා නිවැරදි බව මෙහි පහත අත්සන් කරන මම මෙයින් සහතික කරමි. 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූල වීමට මම මෙයින් පොරොන්දු වෙමි.

............................
අත්සන
(පතල් කළමනාකරු)

---

අලුත් කිරීමට අනුමත කරන ලදී :

වලංගු කාලසීමාව : ....................................

ගෙවිය යුතු රාජ්‍ය භාගය : ........................................

අධ්‍යක්ෂවරයා විසින් බලය දීම : ........................................

දිනය : ........................

..................................
අත්සන
(අධ්‍යක්ෂ ජනරාල්වරයා)

[5(1) නියෝගය]

3.4 ආකෘතිය

**කාර්මික පතල් කැනීමේ බලපත්‍රය -"අ" හෝ "ආ" වර්ගය**

**පැවරීම සඳහා ඉල්ලුම්පත**

1. බලපත්‍ර අංකය :

2. පැවරුම්ලාභියාගේ නම :

3. පැවරුම්ලාභියා පිළිබඳ තොරතුරු :

(අ) පුද්ගලයකු සඳහා :

(i) ඉල්ලුම්කරුගේ/බලයලත් අනුයෝජිතයාගේ නම :

(ii) ලිපිනය :

(iii) ජාතිය :

(iv) වෘත්තිය :

(v) ශ්‍රී ලංකාවෙහි:

(අ) ව්‍යාපාර ස්ථානය :

(ආ) පදිංචිය :

(ආ) සංස්ථාවක් සඳහා :

(i) සමාගමේ/හවුල් ව්‍යාපාරයේ නම :

(ii) සංස්ථාගත කළ රට :

(iii) ප්‍රධාන කාර්යාලය/ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය :

(iv) ශ්‍රී ලංකාවේ - ලියාපදිංචි සමාගමේ/ අනුයෝජිතයාගේ ලිපිනය:

(v) නෛතික/මූල්‍ය දත්ත :

(අ) ප්‍රාග්ධන සම්පාදනය :

(ආ) සාංගමික ව්‍යවස්ථාවලිය (අමුණන්න):

(ඇ) පසුගිය වසර තුනට අදාළ වාර්ෂික වාර්තා (අමුණන්න):

4. තාක්ෂණික/වෘත්තීය දත්ත :

(අ) ඉල්ලුම් කරන ලද ප්‍රදේශය මෙට්‍රික් ක්‍රමය අනුව හැඳින්වීම :

(1:50,000 ස්ථාන නිශ්චයක සිතියම හා මෙට්‍රික් ඒකක අනුසාරයෙන් හැඳින්වීමේ 2:3 ආකෘතිපත්‍රය අමුණන්න)

(ආ) ව්‍යාපෘති කණ්ඩායමේ වෘත්තීය/තාක්ෂණික තත්ත්වය පිළිබඳ සුදුසුකම් (අමුණන්න):

(ඇ) 10 වන ආකෘතිපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ආර්ථික ජීව්‍යතා වාර්තාව (අමුණන්න):

5. පැවරීමේ නියම හා කොන්දේසි :

6. බලපත්‍ර ගාස්තු රිසිට්පත (අමුණන්න):

මෙම ඉල්ලුම්පත්‍රයේ ඇතුළත් ප්‍රකාශ මාගේ උපරිම දැනීම අනුව සත්‍ය බව හා නිවැරදි බව මෙහි පහත අත්සන් කරන මම මෙයින් සහතික කරමි. 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූල වීමට මම මෙයින් පොරොන්දු වෙමි.

සාක්ෂි :

අත්සන.
(පැවරුම්ලාභියා)

---

අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමතය:

දිනය :

අත්සන.
(අධ්‍යක්ෂ ජනරාල්වරයා) ";

(5) 3.4 වන ආකෘතියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන්:-

[5(1) වන නියෝගය]
3.5 වන ආකෘතිය

**" කාර්මික පතල් කැණීම් බලපත්‍රය**
**"අ" හෝ "ආ" වර්ගය**

**ඇප බැඳුම්කර සඳහා ඉල්ලුම්පත**

01. බලපත්‍ර අංකය:

02. (අ) බලපත්‍රලාභියාගේ නම:

(i) පුද්ගලයා:

(ii) සංස්ථාව :

(ආ) ලිපිනය :

03. උකස්ලාභියාගේ/ බඳු ගැණුම්කරුගේ/ වෙනත් තැනැත්තාගේ නම:

04. අර්ථලාභියාගේ නම:

05. ගිවිසුම්ගත, ආර්ථික, මූල්‍ය නියම හා කොන්දේසි (අමුණන්න):

06. ව්‍යාපාර වස්තු අධිකාරියේ ලියාපදිංචිය (අමුණන්න):

07. ඇපය අත්කර ගන්නා තැනැත්තාගේ සහතිකය (අමුණන්න):

08. නියමකර ඇති ඛණිජ සඳහා:

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය:

(ආ) අමාත්‍යවරයාගේ/ අදාළ අමාත්‍යවරයාගේ අනුමතය:

මෙම ඉල්ලුම්පතෙහි ඇතුළත් ප්‍රකාශ මාගේ උපරිම දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව මෙහි පහත අත්සන් කරන මම මෙයින් සහතික කරමි. 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූල වීමට මම මෙයින් පොරොන්දු වෙමි.

සාක්ෂි :

අත්සන.

(බලපත්‍රලාභියා)

---

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමතය:

දිනය:

අත්සන.

(අධ්‍යක්ෂ ජනරාල්වරයා)

(6) 10 වන ආකෘතියේ "කාර්මික පතල් කැණීමේ බලපත්‍රය" යන වචන වෙනුවට "කාර්මික පතල් කැණීමේ බලපත්‍රය ("අ" සහ "ආ" වර්ග සඳහා පමණි)" යන වචන ආදේශ කිරීමෙන්;

(7) 10 වන ආකෘතියට ඉක්බිතිව ම, පහත දැක්වෙන 10අ වන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන්;

[13(1) වන නියෝගය]

10අ වන ආකෘතිය

**'ඇ' සහ 'ඈ' වර්ග සඳහා වන කාර්මික පතල් කැණීම් බලපත්‍රය**

**පතල් හා පුනරුත්ථාපනය කිරීමේ සැලැස්ම**

(කරුණාකර ඔබගේ වැඩබිමට අදාළ කවර හෝ කරුණක් ඉදිරියෙන් හරි ලකුණ යොදා අනවශ්‍ය දේ කපා හරින්න)

1. ව්‍යාපෘති යෝජකයාගේ නම හා ලිපිනය : ..................................................................................................

2. ව්‍යාපෘතියේ විස්තර :

(අ) කැණීම් සඳහා යෝජිත ඛණිජ/ඛණිජ වර්ග- ...............................................................

(ආ) දිස්ත්‍රික්කය- .....................................................

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය- .................................................................

(ඈ) ගම- .......................................................

(ඉ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය- ..........................................................

(ඊ) අදාළ පොලිස් ස්ථානය- .........................................................

(උ) ඔප්පු අංකය- .................................................................

(ඌ) පිඹුරු අංකය- ..............................................................

(එ) ඉඩමේ හිමිකාරත්වය - පෞද්ගලික / රජයේ ඉඩමක් / කැලෑ භූමියක් / ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව/ වනජීවී / මහවැලි සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් / වෙනත් (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න) ...........................................................

(ඒ) යෝජිත කැණීම් සිදු කරනු ලබන ප්‍රදේශයට අදාළ ඉඩමේ වපසරිය- .............................................

(ඔ) ගෝලීය තැන් සෙවුම් පද්ධතිය අනුව මායිමේ පිහිටීම (තිබේ නම්)- ................................................

3. ව්‍යාපෘතියේ අරමුණ :

(අ) සංවර්ධන ව්‍යාපෘති සඳහා ද්‍රව්‍ය සැපයීම ☐

(ආ) වාණිජ අරමුණක් ☐

(ඇ) වගාකිරීම/ ඉදිකිරීම් කාර්යයන්/ වෙනත් කාර්ය සඳහා ඉඩම පිළියෙල කිරීම (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න) ...................................................... ☐

(ඈ) ඉවුරු කැඩීයාම/ නායයාම් උවදුරු වැළැක්වීම සඳහා ඉඩම ස්ථායීකරණය ☐

(ඉ) වෙනත් (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න) .........................................................................

4. කැණීම් සංවර්ධන කටයුතු :

(අ) ඉඩමට බාහිරින්/ ඉඩම ඇතුළතින් ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම ☐

(ආ) පවතින ශාක ආවරණයන් සහිත ප්‍රදේශ ඉවත් කිරීම (කරුණාකර ශාක වර්ගය නිශ්චිතව සඳහන් කරන්න) ................................................................. ☐

(ඇ) මතුපිට පස ඉවත් කිරීම/ මතුපිට පස ප්‍රවාහනය කිරීම ☐

(ඈ) කර්මාන්තශාලා හා යන්ත්‍රෝපකරණ පිහිටුවීම ☐

(ඉ) සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම ☐

(ඊ) වෙනත් (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න) ............................................................ ☐

5. පතල් නිෂ්පාදන කටයුතු :

(අ) අපේක්ෂිත මාසික නිෂ්පාදනය (කියුබ්)....................................................................

(ආ) කැණීම් ක්‍රියාවලියෙහි වර්ගය විවෘත චරිත ☐

භූගත ☐

(ඇ) භූගත කැණීම් සම්බන්ධයෙන් අපේක්ෂිත උස/ ගැඹුර .................................................................

(ඈ) කැණීම් සිදු කිරීම සම්බන්ධයෙන් අපේක්ෂිත කාලසීමාව ...........................................................

(ඉ) බෝර වළක ගැඹුර (ගල් කැඩීමේ කටයුතු සම්බන්ධයෙන් පමණක් අදාළ වේ) ....................................................

(ඊ) එක් දිනකට අපේක්ෂිත පිපිරවීම් සංඛ්‍යාව (ගල් කැඩීමේ කටයුතු සම්බන්ධයෙන් පමණක් අදාළ වේ) . ............................................................

(උ) යන්ත්‍රෝපකරණ වර්ග

| යන්ත්‍රෝපකරණ පිළිබඳ විස්තරය | වර්ගය/ සැකසුම | ඒකක සංඛ්‍යා |
|---|---|---|
| බැකෝ ලෝඩර් | | |
| ජැක් හැමර් | | |
| කොම්ප්‍රෙෂර් | | |
| ෆ්‍රන්ට්එන්ඩ් ලෝඩර් | | |
| ස්ක්‍රෙපර් | | |
| ට්‍රක් රථ | | |

6. සැකසුම් කටයුතු (අදාළ වන්නේ නම්):

(අ) තැලීමේ /කුඩු කිරීමේ /ඇඹරීමේ කර්මාන්තශාලා තිබේද : ඔව්/නැත
(ආ) නිෂ්පාදිතයේ විස්තර :

| කැබලිවල ප්‍රමාණය (මි. මී.) | සාමාන්‍ය අනන්‍යතාවය | |
|---|---|---|
| 20 - 15 හෝ 22 - 17 | 3/4 | ☐ |
| 15 - 10 හෝ 17 - 12 | 1/2 | ☐ |
| 10 - 5 හෝ 12 - 5 | චිප් ගල් | ☐ |
| 5 ට අඩු | ගල් කුඩු | ☐ |

7. අලෙවිකරණ හා විකුණුම් සැලැස්ම :

| නිෂ්පාදනයේ විස්තරය | අපේක්ෂිත මාසික නිෂ්පාදනය (කියුබ්) | ඒකක මිල (රු.) | අපේක්ෂි ආදායම(රු.) |
|---|---|---|---|
| 3/4 | | | |
| 1/2 | | | |
| චිප් ගල් | | | |
| ගල් කුඩු | | | |
| **මුළු ආදායම (රු.)** | | | |

8. මෙහෙයුම් පිරිවැය :

| පිරිවැය කේන්ද්‍රය | මාසික පිරිවැය (රු.) |
|---|---|
| වැටුප් සහ වේතනයන් | |
| ප්‍රවාහනය | |
| යන්ත්‍රෝපකරණවලට අදාළ මෙහෙයුම් පිරිවැය | |
| නඩත්තු පිරිවැය | |
| සෞඛ්‍ය හා ආරක්ෂාව | |
| පාරිසරික ආරක්ෂණය<br>ප්‍රතිසංස්කරණය<br>මුළු වියදම | |

මාසිකව අපේක්ෂිත ලාභය (රු.).........................................................................

9. ප්‍රාග්ධන වියදම්:

| පිරිවැය කේන්ද්‍රය | පිරිවැය (රු.) |
|---|---|
| ඉඩම | |
| ගොඩනැගිල්ල | |
| උපකරණ | |
| ව්‍යාපාරික මූල්‍ය ධනය | |

10. සාමාජීය හා පාරිසරික බලපෑම අධ්‍යයනය:

(අ) මී. 100 ක අරීය දුරින් පිහිටි මනුෂ්‍ය වාසස්ථාන සංඛ්‍යාව - .....................................

(ආ) මී. 100 ක අරීය දුරින් පිහිටි වෙනත් ව්‍යුහයන් (කුළුණු/ පාලම්/ වතුර ටැංකි/ වෙනත්) - ................................................................

(ඇ) අවට ඉඩම් භාවිතයේ රටාව-ස්වභාවික වනාන්තර/ පඳුරු/ ආවරණ බෝග/ මනුෂ්‍ය වාසස්ථාන/ කර්මාන්ත ශාලා/ කුඹුරු - .......................................................

(ඈ) ගංගා, ඇළදොළ වනාන්තර වැනි සමීපයේ පිහිටා ඇති පාරිසරික වශයෙන් වැදගත් ලක්ෂණ - ..........................................................................................

(ඉ) සාමාජීය හා පාරිසරික බලපෑම අවම කිරීම සඳහා පූර්වාරක්ෂක පියවර

| මූලාශ්‍ර බලපෑම | පූර්වාරක්ෂක පියවර |
|---|---|
| ඝෝෂාව | |
| දූවිලි | |
| භූමිය කම්පනය වීම | |
| පීඩනයන් සිදු කරනු ලබන වායු පිපිරුම් | |
| ජල ප්‍රමාණය | |
| මතුපිට හා භූගත ජලය | |
| මාර්ග භාවිතය | |
| වාසස්ථාන කෙරෙහි ඇතිවන බලපෑම | |
| පැළෑටි හා ගස් කෙරෙහි ඇති වන බලපෑම | |
| සාමාජීය බලපෑම | |

11. පතල් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු

| | | |
|---|---|---|
| (අ) | බෑවුම් ස්ථායීතාව ඇති කිරීම සඳහා බංකු ක්‍රමය දියුණු කිරීම | ☐ |
| (ආ) | කැණීම්වල පිරවීම | ☐ |
| (ඇ) | නැවත ගස් සිටුවීම | ☐ |
| (ඈ) | වටාපිටාව තුළට අපවිත්‍ර වූ ජලය ගලා යාම වැළැක්වීම සඳහා කාණු පද්ධතියක් ඇති කිරීම | ☐ |
| (ඉ) | වෙනත් (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න) ............................................................................ ............................................................................................................................................ | |

............................................................... ................................ ”

ව්‍යාපෘති යෝජකයාගේ අත්සන දිනය

(8) 13(2) වන නියෝගයේ 11වන ආකෘතියේ “කාර්මික පතල් කැනීම් බලපත්‍රය (අ සහ ආ වර්ග සඳහා)” යන වචන වෙනුවට “කාර්මික පතල් කැණීමේ බලපත්‍රය (“අ”, “ආ” සහ “ඇ” වර්ග සඳහා පමණි) යන වචන ආදේශ කිරීමෙන්.

07-662

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 A - PG 4586